AAT ශ්‍රී ලංකා ආයතනය මගින් පවත්වනු ලබන විශේෂ සම්මන්ත්‍රණ මාලාව

මෙහෙයවීම : හේමාල් පෙරේරා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021
கலவிப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2021
General Certificate of Education (Adv. Level) Examination, 2021

ගිණුම්කරණය II
கணக்கடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணத்தியாலம்
Three hours

උපදෙස් :
- **පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් අරඹන්න.**
- **අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.**

01. VAT සඳහා ලියාපදිංචි සී/ස සරණපාල සමාගමේ 2021.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

විස්තරය	හර (රු.'000)	බැර (රු.'000)
2020.04.01 වෙළඳ තොග	450	
බදු ගෙවීම්	500	
වැටුප් හා වේතන (පරිපාලන)	630	
ගැණුම් හා වියදම් මත ගෙවූ VAT	200	
ගැණුම්	4 400	
2020.04.01 දේපළ පිරියත හා භාවිත අයිතිය ඇති වත්කම්	8 200	
මුදල් හා මුදල් සමාන දෑ	3 560	
අධ්‍යක්ෂ සංවේතන	450	
අනෙකුත් පරිපාලන වියදම්	320	
බෙදාහැරීමේ වියදම්	300	
වෙළඳ ලැබිය යුතු දෑ	800	
2020.04.01 දිනට VAT ගිණුම		50
විකුණුම්		10 500
2020.04.01 දිනට ආදායම් බදු වෙන් කිරීම		600
2020.04.01 දිනට ගොඩනැගිලි ප්‍රත්‍යාගණන සංචිතය		100
කල්බදු ණයහිමියෝ		2 550
විකුණුම් මත එකතු කළ VAT		420
2020.04.01 ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		4 000
[කොටස් සංඛ්‍යාව 20 000]		
2020.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		1 130
වෙළඳ ගෙවිය යුතු දෑ		100
2020.04.01 වගකීම් සහතික වෙන් කිරීම		200
2020.04.01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ වෙන් කිරීම		160
	19 810	19 810

Hemal Perera

අතිරේක තොරතුරු,

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම් කළ යුතු වේ.

(i) වෙළඳ තොගවල පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයන් පහත පරිදි වේ.

තොගය	**පිරිවැය (රු.)**	**ශුද්ධ උපලබ්ධි අගය (රු.)**
2020.03.31	480 000	450 000
2021.03.31	260 000	280 000

2020.04.01 දිනට පැවති වෙළඳ තොගය 2020/2021 ගිණුම් වර්ෂය තුල සම්පූර්ණයෙන්ම විකුණා ඇත.

(ii) වර්ෂය තුල ගෙවූ බදු සංයුතිය පහත පරිදි වේ.

එකතු කළ අගය මත බදු	රු.	70 000
2019/2020 සඳහා අවසාන ආදායම් බදු	රු.	350 000
2020/2021 සඳහා ආදායම් බදු	රු.	80 000
	රු.	500 000

2020/2021 වර්ෂය සඳහා ආදායම් බදු ලෙස රු. 280 000 ඇස්තමේන්තු කර ඇත.

(iii) 2021.03.31 දිනට වෙළඳ ලැබිය යුතු ශේෂයෙන් රු. 30 000 ක් බොල් ණය කපා හැර ඉතිරි ශේෂය මත 10% ක් හානිකරණ අලාභ වෙන් කිරීමක් කළ යුතුය.

(iv) 2021.03.31 දිනට උපචිත විදුලිය රු. 40 000 කි.

(v) සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණන අතර, පසුගිය වසරේ සිදුකරන ලද විකුණුම් වෙනුවෙන් රු. 150 000 ක වගකීම් සහතික ගෙවීම් ප්‍රවර්තන වර්ෂය තුළ සිදු කර ඇත. එය බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත් කර ඇත. 2021.03.31 දිනට වගකීම් සහතික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය විකුණුම් වලින් 2% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(vi) 2020.04.01 දිනට දේපළ, පිරියත හා උපකරණ හා භාවිත අයිතිය ඇති වත්කම්හි පිරිවැය / ප්‍රත්‍යාගණන අගය හා සමුච්චිත ක්ෂය සංයුතිය පහත පරිදි වේ.

වත්කම	**පිරිවැය / ප්‍රත්‍යාගණන අගය (රු.'000)**	**සමුච්චිත ක්ෂය (රු.'000)**	**ධාරණ අගය (රු.'000)**
ඉඩම් - ප්‍රත්‍යාගණන අගය	3 000	-	3 000
ගොඩනැගිලි - ප්‍රත්‍යාගණන අගය	3 500	1 500	2 000
උපකරණ - පිරිවැය	1 000	200	800
භාවිත අයිතිය ඇති මෝටර් රථ - පිරිවැය	4 000	1 600	2 400
	11 500	3 300	8 200

සියලුම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිතා කරන අතර වාර්ෂිකව සරළ මාර්ග ක්‍රමයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත පහත අනුපාත යටතේ ක්ෂය කළ යුතුය.

ගොඩනැගිලි	5%
උපකරණ	10%
භාවිත අයිතිය ඇති වත්කම්	20%

Hemal Perera

(vii) 2020.10.01 දින ඉඩම් රු. 3 800 000 කට හා ගොඩනැගිලි රු. 2 500 000 ක් ලෙස සුදුසුකම්ලත් තක්සේරුකරුවකු විසින් අගය කර ඇත. ඒ පිළිබඳව කිසිදු සටහනක් තබා නොමැත. ඉඩම් ප්‍රථමවරට ප්‍රත්‍යාගණනයේ දී රු. 100 000 ක ප්‍රත්‍යාගණන අලාභයක් වාර්තා කර ඇති අතර, ගොඩනැගිලි ප්‍රථම වර ප්‍රත්‍යාගණන ලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ දක්වා ඇත.

(viii) 2018.04.01 වර්ෂ 5 ක කාලයක් සඳහා දිගුකාලීන කල්බදු පදනම මත ලබාගත් මෝටර් රථයේ වාර්ෂික කල්බදු වාරිකය රු. 1 100 000 ක් වන අතර වර්ෂ 5 ට අදාල වාර්ෂික කල්බදු පොලී පහත පරිදි වේ.

වර්ෂය	**පොලිය (රු.'000)**
2018/2019	400
2019/2020	350
2020/2021	300
2021/2022	250
2022/2023	200

වසර තුළ ගෙවූ කල්බදු වාරිකය වෙළඳ ණයහිමි ගිණුමට හර කර ඇති අතර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(viii) 2021.01.01 දින රු. 400 000 කට උපකරණ මිලට ගෙන ඇති අතර එය ගැණුම් ගිණුමේ වාර්තා කර ඇත.

(ix) පරිපාලන සේවකයින් සඳහා වැටුප් ගෙවීමේදී සේවක අර්ථ සාධක සඳහා 10% ක් අඩුකරගෙන මුදලින් ගෙවූ ශුද්ධ වැටුප පමණක් සටහන් කර ඇත. සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා සමාගම විසින් 15% හා 5% බැගින් දායක වේ. 2020/2021 වර්ෂය සඳහා අදාල වෙන් කිරීම් මේ දක්වා සිදුකර නොමැත.

(x) 2021.03.31 දින අධ්‍යක්ෂකවරු පහත තීරණ ගෙන ඇත.

- 2021.03.31 දිනට තිබූ සෑම සාමාන්‍ය කොටස් 8 කට ම 1 ක් බැගින් කොටසක් රු. 200 බැගින් රඳවාගත් ලාභය ප්‍රාග්ධනිත කළ යුතුය.
- රඳවාගත් ලාභය රු. 100 000 ක මුදලක් මාරු කර පොදු සංචිතයක් ඇති කිරීම.
- 2021.02.28 දිනට තිබූ සාමාන්‍ය කොටසක් සඳහා රු. 2 ක ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂකවරු විසින් 2021.03.31 දින යෝජනා කර ඇත.

අවශ්‍ය වන්නේ,

ප්‍රසිද්ධ කිරීම සඳහා සුදුසු ආකෘතියක් භාවිතා කරමින් පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

(1) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.

(2) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය.

(3) 2021.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

[මුළු ලකුණු 40]

Hemal Perera

02. (අ) ඒකකයක් නිපදවීමට Y අමුද්‍රව්‍ය 2 kg ක් අවශ්‍ය වන අතර ඊට අදාලව පහත තොරතුරු ඔබට සපයා ඇත.

	උපරිම	**සාමාන්‍ය**
මාසයක් තුළ නිෂ්පාදන ඒකක	1 600	1 200
අමුද්‍රව්‍ය ඇණවුම් කාලය සති	5	4

උපරිම තොග මට්ටම අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 20 000

අවශ්‍ය වන්නේ,

(1) Y අමුද්‍රව්‍යයට අදාලව

(i) යළි ඇණවුම් මට්ටම.

(ii) අවම තොග මට්ටම.

(iii) යළි ඇණවුම් ප්‍රමාණය.

(iv) සාමාන්‍ය තොග මට්ටම.

(2) "යළි ඇණවුම් ප්‍රමාණය ආර්ථික ඇණවුම් ප්‍රමාණයට සැම විටම සමාන වේ." යන ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව පහදන්න.

[ලකුණු 16 යි]

Hemal Perera

(ආ) A හා B ලෙස භාණ්ඩ දෙකක් නිපදවන නිෂ්පාදන සමාගමක අසම්පූර්ණ පොදුකාර්ය විශ්ලේෂණ පත්‍රිකාවක් ඔබට ලබා දී ඇත.

(රු.'000)

පොදුකාර්ය පිරිවැය	**විභාජන පදනම**	**එකතුව**	**යන්ත්‍ර දෙපාර්තමේන්තුව**	**නිමවුම් දෙපාර්තමේන්තුව**	**ගබඩා අංශය**
බෙදාහරින ලද පොදු කාර්ය පිරිවැය		4 640	1 950	2 142	548
විදුලිය		300			
ගොඩනැගිලි කුලී		480			
යන්ත්‍ර ක්ෂය		500			
සේවක සුභ සාධක වියදම්		330			

අතිරේක තොරතුරු,

(i)

විස්තරය	**යන්ත්‍ර දෙපාර්තමේන්තුව**	**නිමවුම් දෙපාර්තමේන්තුව**	**ගබඩාව**	**එකතුව**
කිලෝවොට් පැය	20 000	8 000	2 000	30 000
යන්ත්‍ර පිරිවැය (රු.'000)	400 000	100 000	-	500 000
බිම් ප්‍රමාණය (වර්ග මීටර)	240	180	60	480
සේවක සංඛ්‍යාව	10	18	2	30

(ii) ගබඩාව යන්ත්‍ර දෙපාර්තමේන්තුවට හා නිමවුම් දෙපාර්තමේන්තුවට පිළිවෙළින් 7 : 6 අනුපාතයට සේවා සපයයි.

(iii) යන්ත්‍ර දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය පදනම මතද නිමවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය පදනම මත ද අන්තර්ග්‍රහණය කරයි.

(iv) සමාගම නිපදවන ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය මත 20% ලාභයක් තබා භාණ්ඩ අලෙවි කරයි.

(v) සමාගම විසින් නිපදවනු ලබන අතර භාණ්ඩ දෙක සඳහා පහත තොරතුරු සපයා ඇත.

විස්තරය	**A වර්ගය**	**B වර්ගය**
ඒකකයක ප්‍රාථමික පිරිවැය (රු.)	850	650
ඒකකයක් සඳහා අවශ්‍ය අයවැයගත පැය		
යන්ත්‍ර පැය	2	2.5
ශ්‍රම පැය	2	1
ඒකකයක් සඳහා අවශ්‍ය සත්‍ය පැය		
යන්ත්‍ර පැය	2.5	1.5
ශ්‍රම පැය	1.5	2
නිපදවූ ඒකක ගණන	2 000	1 000

අවශ්‍ය වන්නේ,

(1) විභාජන පදනම දක්වමින් සම්පූර්ණ කරන ලද පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (දෙවන විභාජනය ද ඇතුළුව)

(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත.

(3) A හා B භාණ්ඩ සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය වෙන වෙනම ගණනය කරන්න.

(4) A හා B භාණ්ඩ සඳහා විකුණුම් මිල වෙන වෙනම ගණනය කරන්න.

[ලකුණු 24 යි]
[මුළු ලකුණු 40 යි]

Hemal Perera

03. මාධවගේ ව්‍යාපාරයේ 2021.01.01 දිනට පැවති ශේෂ පහත පරිදි වේ.

	(රු.'000)
ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය)	4 000
මෝටර් රථ (පිරිවැය)	6 000
ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම්	1 400
මෝටර් රථ ක්ෂය වෙන් කිරීම්	2 000
තොග	1 600
වෙළඳ ලැබිය යුතු	1 000
අඩමාණ ණය වෙන් කිරීම්	100
මුදල් හා සමාන දෑ	900
12% බැංකු ණය	2 000
වෙළඳ ගෙවිය යුතු	1 000

2021.03.31 දිනෙන් අවසන් කාර්තුවේ පහත ගනුදෙනු සිදු විය.

(1) රු. 2 000 000 ක මිලදී ගත් තොග වලින් 60% ක් ණයට හා ඉතිරිය අත්පිට මුදලට වේ.

(2) ආරම්භක වෙළඳ ණයහිමියන්ට 10% ක වට්ටමකට යටත්ව ගෙවා ඇත.

(3) රු. 1 800 000 ක තොග වලින් $^1/_3$ ක් රු. 1 000 000 කට අත්පිට විකුණූ අතර ඉතිරිය රු. 1 800 000 කට ණයට විකුණා ඇත.

(4) ණයට විකුණූ තොග වලින් පිරිවැය රු. 60 000 ක තොග ආපසු එවා ඇත.

(5) එක් සේවකයෙකුට මාසිකව රු. 10 000 බැගින් කාර්තුව සඳහාම සේවකයන් දෙදෙනෙකුට වැටුප් ගෙවා ඇත.

(6) 2021.03.31 දින බැංකු ණය වාරිකය රු. 260 000 ක් ගෙවා ඇත.

(7) වෙළඳ ලැබිය යුතු දෑ වලින් රු. 90 000 ක වට්ටමකට යටත්ව ලද මුදල රු. 910 000 කි.

(8) කාර්තුවේ ඉතිරි මෙහෙයුම් වියදම් රු. 120 000 ක් වූ අතර කාර්තුව රු. 100 000 පමණක් ගෙවා ඇත.

(9) මාධව විසින් මාර්තු මාසය තුළ මුදල් රු. 50 000 ගැනිලි සිදු කර ඇත.

(10) 2021.03.01 දින රු. 1 000 000 ක් වටිනා කාර්යාල උපකරණ අයිතිකරු විසින් යොදවා ඇත.

(11) කාර්තුවට අදාල කොමිස් ආදායම රු. 60 000 ක් වූ අතර රු. 40 000 ක් ලැබී ඇත.

<u>**අතිරේක තොරතුරු,**</u>

(i) සියළු දේපළ පිරියත උපකරණ වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත 12% ක් ක්ෂය කරයි. (ඉඩම්වල අගය රු. 2 000 000 කි.)

(ii) 2021.03.31 දිනට පැවති තොගයෙන් රු. 860 000 ක පිරිවැය වූ තොග 2021.04.02 දින රු. 800 000 කට විකුණා ඇත.

(iii) 2021.03.31 දිනට වෙළඳ ලැබිය යුතු ශේෂය මත 10% ක් අඩමාණ ණය වෙන් කිරීම කළ යුතුය.

(iv) සියළු ගනුදෙනු බැංකු ගිණුම හරහා සිදු කර ඇති අතර කාර්තුවේ බැංකු ප්‍රකාශය පහත දක්වා ඇත.

බැංකු විස්තරය (රු.'000)

	හර	බැර	ශේෂය
ශේෂය			1 100
ගැනුම්	600		500
වෙළඳ ණයහිමි	900		(400)
වෙළඳ ණයගැති		600	200
සේවක වැටුප්	30		170
ණය වාරික	260		(90)
විකුණුම්		800	710
ගැනිලි	50		660
කොමිස් ආදායම්		40	700
බැංකු ගාස්තු	10		690
ණයගැති සෘජු ප්‍රේෂණ		210	900
මෙහෙයුම් වියදම්	160		740

Hemal Perera

(v) 2020.12.31 අවසන් කාර්තුව සඳහා පිළියෙළ කළ බැංකු සැසඳුම් පහත වේ.

බැංකු සැසඳුම් ප්‍රකාශය **(රු.'000)**

සංශෝධිත මුදල් ගිණුම අනුව ශේෂ		900
+ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්		
ගැනුම්	200	
මෙහෙයුම් වියදම්	160	360
		1 260
(–) තැම්පත් කළත් උපලබ්ධි නොවූ චෙක් (ණයගැති ලැබීම්)	160	(160)
බැංකු ප්‍රකාශයට අනුව ශේෂය		1 100

අවශ්‍ය වන්නේ,

(1) ඉහත ගනුදෙනු (ආරම්භක ශේෂ ද සහිතව 1 සිට 11 දක්වා) පහත සමීකරණයට ඇතුලත් කරන්න.

ජංගම නොවන වත්කම් + තොග + වෙළඳ ලැබිය යුතු + වෙනත් ලැබිය යුතු + මුදල් = වෙළඳ ගෙවිය යුතු + වෙනත් ගෙවිය යුතු + හිමිකම්

(2) මාධවගේ ව්‍යාපාරයේ 2021.03.31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය.

(3) 2021.03.31 දිනට මුදල් පාලන ගිණුමේ හා බැංකු ප්‍රකාශයේ ශේෂ අසමාන විය. ඒ අනුව පහත දෑ පිළියෙල කරයි.

(i) සංශෝධිත මුදල් පාලන ගිණුම.

(ii) බැංකු සැසඳුම් ප්‍රකාශය.

(4) 2021.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ වෙළඳ තොග, වෙළඳ ණයගැති, මුදල්, වෙළඳ ණයහිමි ශේෂ.

[මුළු ලකුණු 40 යි]

Hemal Perera

04. **(අ)** 2020/2021 වර්ෂයේ ව්‍යාපාරයක වෙළඳ ණයගැති ලෙජරය තුළින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

(1)

වෙළඳ ණයගැතියා	**විකුණුම් (රු.)**	**ආපසු එවුම් (රු.)**	**ලද මුදල් පිළිබඳ විස්තර**
අසේල	800 000	80 000	ආරම්භක ශේෂය හා රු. 100 000 ක මුදලක්
රුවන්	400 000	4 000	10% ක වට්ටමකට යටත්ව රු. 450 000 ක මුදලක්
විමලවීර	600 000	20 000	රු. 500 000 ක මුදලක්

(2) 2020.04.01 දිනට ව්‍යාපාරයේ පහත වෙළඳ ණයගැති ශේෂ පැවතුණි.

	(රු.)
අසේල	84 000
රුවන්	50 000
විමලවීර	(1 000)
	133 000

(3) 2020.03.31 දිනට පැවති වෙළඳ ණයගැති ශේෂ ලැයිස්තුවේ ශේෂය, වෙළඳ ණයගැති පාලන ගිණුමේ ශේෂය සමඟ සමාන වූ අතර 2021.03.31 දිනට වෙළඳ ණයගැති පාලන ගිණුමේ ශේෂය, වෙළඳ ණයගැති ශේෂ ලැයිස්තුවේ ශේෂය සමඟ සමාන නොවීය. වෙනසට හේතු පසුව අනාවරණය විය.

(i) අසේලගේ ආපසු එවුම් ඔහුගේ ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 8 400 ක් ලෙසය.

(ii) විමලවීරගේ ආරම්භක බැර ශේෂය හර ශේෂයක් ලෙස සලකා පාලන ගිණුමේ ආරම්භක ශේෂ ඉදිරියට ගෙන ඇත.

(iii) යන්ත්‍ර ණයට විකුණුම් රු. 1 000 000 ක් වෙළඳ ණයගැති පාලන ගිණුමේ සටහන් වී ඇත.

(iv) පෙර වර්ෂයේ කපාහරින ලද රු. 5 000 ක බොල්ණයක් මෙම වසරේ ලැබී එය වෙළඳ ණයගැති පාලන ගිණුම බැර කර ඇත.

(v) රුවන්ට ලබාදුන් වට්ටම පාලන ගිණුමේ හරට සටහන් කර ඇති අතර වෙළඳ ණයගැති රුවන්ගේ ගිණුමේ සටහන් වී නොමැත.

(vi) විමලවීරගේ විකුණුම් ඔහුගේ ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 660 000 ක් ලෙසය.

(vii) ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 11 400 ක් අඩුවෙන් එකතු කර ඇත.

අවශ්‍ය වන්නේ,

(1) දැනට පිළියෙල කර ඇති වෙළඳ ණයගැති පාලන ගිණුම.

(2) සංශෝධිත වෙළඳ ණයගැති පාලන ගිණුම.

(3) සංශෝධිත වෙළඳ ණයගැති පාලන ගිණුමේ ශේෂයෙන් ආරම්භ කර ශේෂ ලැයිස්තුවේ ශේෂය දැක්වෙන ප්‍රකාශයක්.

(4) 2021.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්විය යුතු වෙළඳ ණයගැති ශේෂය.

[ලකුණු 20 යි]

Hemal Perera

(ආ) ‘දිරිය දියණියෝ’ කාන්තා සංගමය ස්වයං රැකියාවල නියුතු කාන්තාවන් සඳහා ණය සපයන හා ඔවුන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කරන ආයතනයකි.

සංගමය විසින් අරමුදල් තර කර ගැනීමේ අරමුණින් ඔවුන් නිපදවන අමුරෙදි වලින් නිපද වූ බෑග් සඳහා වෙළඳ සල්පිලක් ද සංවිධානය කර ඇත.

සංගමය සඳහා 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාල වේ.

(i) මුදල් ලැබීම් හා ගෙවීම් සාරාංශය (රු.’000)

<u>මුදල් ලැබීම් :</u>

වෙළඳ සල්පිලේ ආදායම (බෑග් 195 විකුණා ඇත.	850
අලෙවි සල්පිලේ දී රු. 50 000 වට්ටම් අඩු කර ඇත.)	
සාමාන්‍ය පරිත්‍යාග	100
සාමාජික මුදල්	240

<u>මුදල් ගෙවීම් :</u>

අමුරෙදි මිලට ගැනුම්	350
පරිපාලන වියදම්	200
බෑග් අලෙවි සල්පිල් වියදම්	25
සාමාජිකයන්ට ලබාදුන් ණය	60
බෑග් නිෂ්පාදන වක්‍ර වියදම්	70

(ii) 2021.04.01 දිනට නිමකළ බෑග් 10 ක් ඉතිරිව තිබූ අතර, ඒවා එකක් රු. 3 800 කි. 2021.03.31 දිනට ඉතිරි බෑග් 15 කි.

(iii) එක් බෑගයක් නිපදවීම සඳහා අයෙකුට රු. 500 ක මුදලක් ගෙවිය යුතුය. මුදල් නිසි පරිදි ගෙවා ඇතත් ඒ පිළිබඳ ගිණුම් තබා නොමැත.

(iv) පරිපාලන වියදම් වලින් 25% අදාල වන්නේ වෙළඳ සල්පිල් සංවිධානය කිරීම සඳහා වේ.

(v) වත්කම් හා වගකීම්

	2021.04.01 දිනට (රු.'000)	**2021.03.31 දිනට (රු.'000)**
අමුරෙදි	30	50
කලින් ලද සාමාජික මුදල්	40	60
ලැබිය යුතු සාමාජික මුදල්	-	10
මහන යන්ත්‍ර - ධාරණ අගයට	500	450

අවශ්‍ය වන්නේ,

(1) බෑග් නිෂ්පාදනය සඳහා 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ප්‍රකාශය.

(2) එක් බෑගයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(3) අලෙවි සල්පිල් වෙළඳ ගිණුම. / ආදායම් ප්‍රකාශය.

(4) කාන්තා සංගමයේ ආදායම් හා වියදම් ප්‍රකාශනය. ***[ලකුණු 20]***

[මුළු ලකුණු 40]

Hemal Perera

05. (අ) 2018.04.01 දින ආරම්භ කරන ලද සම සමව ලාභ අලාභ බෙදාගන්නා අමර හා කසුන්ගේ හවුල් ව්‍යාපාරයේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ ගණනය කර විසර්ජනයෙන් පසු පහත ගිණුමේ ශේෂ අදාල වේ.

		අමර	**කසුන්**
2020.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම්	(රු.)	800 000	600 000
2021.03.31 දිනට ජංගම ගිණුම්	(රු.)	120 000	260 000

පහත සඳහන් එකඟතාවයන් වර්ෂයේ ලාභ බෙදාහැරීමේදී සැලකිල්ලට ගෙන ඇත. වර්ෂයේ ලාභය නිවැරදිව විසර්ජනය කර ඇත.

- අමර සඳහා වාර්ෂිකව රු. 40 000 ක වේතන හිමි වේ.
- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% ක පොලී ගෙවීම.

2020/2021 වර්ෂයේ ලාභ ගණනය කිරීමේදී පහත වැරදි හා මගහැරීම් සිදු වී ඇත.

(i) 2020.10.01 දින ගෙවන ලද ගොඩනැගිලි කුලිය රු. 360 000 කි. මෙම කුලිය 2021.09.30 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වේ. ගෙවූ සම්පූර්ණ මුදල් ලාභ ගණනය සඳහා යොදාගෙන ඇත.

(ii) 2021.03.31 දිනට වෙළඳ තොගය රු. 150 000 ලෙස ගිණුම් තබා ඇත. මෙම තොගයේ අපේක්ෂිත ශුද්ධ විකුණුම් මිල වූ රු. 110 000 පිළිබඳ සැලකිල්ලට ගෙන නොමැත.

(iii) 2018.07.01 දින මිලට ගත් පිරිවැය රු. 400 000 ක දේපලක් 2021.03.31 දින විකුණා ලද මුදල රු. 170 000 ක් විකුණුම් ගිණුමට මාරු කිරීම හැර වෙනත් සටහනක් තබා නොමැත. දේපළ වාර්ෂිකව පිරිවැය මත 20% ක් ක්ෂය ගලපනු ලැබේ.

(iv) 2020.04.01 දින කසුන් සපයන ලද රු. 100 000 ක ණය සඳහා වාර්ෂිකව 5% ක පොලී ගෙවීම මගහැරී ඇත.

(v) කසුන්ගේ පුද්ගලික ගබඩාවක ව්‍යාපාරයේ තොග තබා ගැනීම් වෙනුවෙන් පළමු කාර්තු තුන සඳහා රු. 30 000 ගෙවා ඇත. අවසාන කාර්තුව සඳහා රු. 10 000 ක මුදල් වර්ෂය අවසාන වන තෙක් ගෙවා නැත. ගෙවූ මුදල් පමණක් ලාභ ගණනයේ දී සැලකිල්ලට ගෙන ඇත.

2021.03.31 දින රු. 1 000 000 ක මුදලක් යොදවා පියුම් හවුල් ව්‍යාපාරයට ලාභයෙන් $^1/_5$ ක කොටසක් සඳහා බඳවාගෙන ඇත. පැරණි හවුල්කරුවන් ඉතිරි ලාභය සමානව බෙදා ගැනීමට එකඟ වී ඇත. එදින රු. 250 000 ලෙස කීර්ති නාමය අගය කර ඇත. පියුම්ගේ පැමිණීමට අදාල කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

අවශ්‍ය වන්නේ,

(1) ඉහත වැරදි හා මගහැරීම් මත වර්ෂයේ ලාභයට සිදු වූ සමස්ථ බලපෑම ගණනය කරන්න.

(2) ඉහත වැරදි හා මගහැරීම් නිවැරදි කිරීමට අවශ්‍ය පොදු ජ'නල සටහන්. [සංලක්ෂය අවශ්‍ය නොවේ.]

(3) 2021.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු හිමිකම සඳහා උධෘතය.

[ලකුණු 20]

(ආ) විශ්ව යෞවන සමාජය අරමුදල් තර කර ගැනීම සඳහා විවෘත සය සාමාජික ක්‍රිකට් තරගාවලියක් දෙදිනක් සඳහා සංවිධානය කිරීමකට අදාළ පහත තොරතුරු රැස්කරගෙන ඇත.

	(රු.)
එක් කණ්ඩායමකින් අය කරන ගාස්තුව	15 000
ත්‍යාග සඳහා මුදල් (රු. 20 000 ක් පරිත්‍යාග ලෙස ලැබේ)	30 000
කුසලාන සඳහා	20 000
විනිසුරුකරුවන් සඳහා දිනක දීමනා	10 000
සංගීත කණ්ඩායම (DJ) සඳහා	25 000
එක් කණ්ඩායමක් සඳහා ලබාදෙන ආහාර හා පාන	3 000
එක් ක්‍රීඩකයකු සඳහා ඇඳුම් සඳහා	1 000
ක්‍රීඩාපිටිය සඳහා මුළු කුලිය	15 000

අවශ්‍ය වන්නේ,

(1) ක්‍රීඩා තරගය සඳහා වැය වන මුළු ස්ථාවර පිරිවැය ගණනය කරන්න.

(2) එක් කණ්ඩායමක් සඳහා දායකය ගණනය කරන්න.

(3) ක්‍රිකට් තරගාවලිය සඳහා වැයවේ යැයි අපේක්ෂා කරන ඇස්තමේන්තුගත වියදම් ආවරණය කර ගැනීමට සහභාගී විය යුතු ක්‍රීඩා කණ්ඩායම් ගණන කොපමණද?

(4) ක්‍රීඩා කණ්ඩායම් 12 ක් සහභාගී වන්නේ නම් අපේක්ෂිත ලාභ හෝ අලාභ ගණනය කරන්න.

(5) යෞවන සමාජය සඳහා රු. 60 000 ක ලාභයක් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් සහභාගී විය යුතු කණ්ඩායම් ගණන කොපමණද?

(6) ත්‍යාග මුදල් සඳහා නියමිත පරිත්‍යාග මුදල් නොලැබෙන බවත් හා විනිසුරුවරුන් සඳහා අතිරේක රු. 10 000 ක විශේෂ දීමනාවක් ගෙවිය යුතුවන තත්වයකදී (අනෙකුත් පිරිවැය තොරතුරු වෙනස් නොවේ.) කණ්ඩායම් 15 ක් පමණක් පැමිණේ යැයි අපේක්ෂා කිරීමකදී සියළු පිරිවැය ආවරණය වීම සඳහා එක් කණ්ඩායමකින් අයකළ යුතුවන මුදල කොපමණද?

[ලකුණු 20]
[මුළු ලකුණු 40]

Hemal Perera

06. **(අ)** සීමිත මැන්ඩිස් පොදු සමාගමේ 2020.03.31 දිනට හා 2021.03.31 දිනට පිළියෙල කරන ලද සාරාංශගත මූල්‍ය ප්‍රකාශනය පහත පරිදි වේ.

මූල්‍ය තත්ව ප්‍රකාශය **(රු.'000)**

<u>ජංගම නොවන වත්කම්</u>	**2021.03.31**	**2020.03.31**
දේපළ පිරියත උපකරණ (ධාරණ අගය)	18 000	15 000
ස්ථාවර තැන්පතුව	2 100	
<u>ජංගම වත්කම්</u>		
තොගය	3 400	3 000
වෙළඳ ණයගැතියෝ	2 000	2 400
ඉදිරියට ගෙවූ මෙහෙයුම් වියදම්	80	100
මුදල් හා මුදල් සමාන දෑ	5 380	900
	30 960	21 400
<u>හිමිකම</u>		
ප්‍රකාශ කළ ප්‍රාග්ධනය	14 000	11 000
පොදු සංචිතය	5 000	4 000
ප්‍රත්‍යාගණන සංචිතය	1 600	1 200
රඳවාගත් ඉපැයීම්	5 600	2 600
<u>ජංගම නොවන වගකීම්</u>		
10% දිගුකාලීන ණය	800	
<u>ජංගම වගකීම්</u>		
වෙළඳ ණයහිමියෝ	3 200	2 000
ගෙවිය යුතු බදු	600	400
මෙහෙයුම් වියදම් (පොලී හැර)	120	200
ගෙවිය යුතු පොලී	40	-
	30 960	30 960

Hemal Perera

අතිරේක තොරතුරු,

(i) කාල පරිච්ඡේදයේ ආදායම් බදු වියදම රු. 1 000 000 ක් වූ අතර, මෙහෙයුම් වියදම පහත පරිදි වේ.

පරිපාලන වියදම	රු.	1 800 000
බෙදාහැරීමේ වියදම	රු.	1 000 000
දේපල උපකරණ ක්ෂය	රු.	600 000
මුළු මෙහෙයුම් වියදම්		3 400 000

ව්‍යාපාරය දිගුකාලීන ණය 2020.07.01 දින ලබාගෙන ඇති අතර පොලී වියදම පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ.

(ii) ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් අමතර ආදායම රු. 1 100 000 ක් වූ අතර ඒ තුළ ස්ථාවර තැන්පත් පොලිය සහ මෝටර් රථ ඉවත් කිරීමේ ලාභය ඇතුළත් වේ.

(iii) 2020.04.01 දින රු. 2 000 000 ක් වූ ස්ථාවර තැන්පතුව ආරම්භකර ඇති අතර කාලපරිච්ඡේදයේ ස්ථාවර තැන්පතු පොලිය ද ස්ථාවර තැන්පතු වටිනාකමට එකතු කර ඇත. ස්ථාවර තැන්පතු පොලිය කල්පිරීමේ දී ලැබේ.

(iv) 2020.04.01 ධාරණ අගය රු. 5 000 000 ක් වූ මෝටර් රථයක් ඉවත් කර එදිනම මෝටර් රථයක් මිලට ගෙන ඇත.

(v) කාලපරිච්ඡේදයේ දී ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඇත.

(vi) 2021.03.31 න් අවසන් වර්ෂයේ ගෙවූ ලාභාංශ රු. 20 000 කි.

අවශ්‍ය වන්නේ,

LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) ප්‍රමිතියට අනුව 2021.03.31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

[ලකුණු 20]

(ආ) සීමිත පසිඳු පොදු සමාගමේ සාරංශගත මූල්‍ය ප්‍රකාශනය පහත පරිදි වේ.

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය **(රු.'000)**

විකුණුම්	3 000
විකුණුම් පිරිවැය	(1 800)
දළ ලාභය	1 200
වියදම්	(375)
බදු පෙර ලාභය	825
ආදායම් බදු	(75)
වර්ෂය සඳහා ලාභය	750
වෙනත් විස්තීරණ ආදායම්	
දේපළ උපකරණ ප්‍රත්‍යාගණනය	400
මුළු විස්තීරණ ආදායම	1 150

2021.03.31 දිනට හා 2020.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශ පහත දැක්වේ. **(රු.'000)**

	2021.03.31	2020.03.31
දේපළ පිරියත උපකරණ	2 650	1 600
තොගය	250	350
වෙළඳ ණයගැතියෝ	300	100
බැංකු	200	260
	3 400	2 310
ප්‍රකාශිත ප්‍රාග්ධනය	1 400	1 400
රඳවාගත් ඉපැයීම	600	50
ප්‍රත්‍යාගණන සංචිතය	400	-
බැංකු ණය	500	500
වෙළඳ ණයහිමියෝ	375	300
ගෙවිය යුතු පොලී	60	40
ගෙවිය යුතු බදු	65	20
	3 400	2 310

Hemal Perera

අතිරේක තොරතුරු,

- මුළු විකුණුම් වලින් 80% ක් ණයට විකුණුම් වේ.
- වසරකට දින 360 යැයි උපකල්පනය කරන්න.
- වසර තුළ ණය පොලී සඳහා රු. 80 000 ක් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

2021.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම.

(1) ශුද්ධ ලාභ අනුපාතය

(2) තොග පිරිවැටුම් අනුපාතය

(3) ණය එකතු කිරීමේ කාලය දින

(4) පොලී ආවර්ණ අනුපාතය

(5) ණය අනුපාතය (මුළු ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය) ***[ලකුණු 10]***

(ඇ) සී/ස මදුරපුර සමාගම පිරිවැය රු. මිලියන 2 වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාලව පහත තොරතුරු සපයා ඇත.

- යන්ත්‍රයේ අපේක්ෂිත ජීව කාලය වර්ෂ 4 කි. ජීව කාලය අවසානයේදී යන්ත්‍රය ගලවා ඉවත් කිරීම වෙනුවෙන් රු. 300 000 වැයවන අතර එය සුන්බුන් ලෙස විකිණීමෙන් රු. 900 000 ක මුදලක් ලබාගත හැක.
- යන්ත්‍රය භාවිතා කරමින් නිෂ්පාදනය කරන X නැමති භාණ්ඩය වෙනුවෙන් පහත තොරතුරු අදාළ වේ.

වර්ෂය	**1**	**2**	**3**	**4**
නිෂ්පාදනය (ඒකක)	160	250	400	400
අදාල වර්ෂය අවසාන දිනට ඉතිරි තොග (ඒකක)	10	30	50	-
ඒකකයක දායකය (රු.)	2 000	2 000	2 500	3 000

- තුන්වන වර්ෂයේ සිට වාර්ෂික නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයේ වැඩවීම (යන්ත්‍ර ක්ෂය හැර) රු. 350 000 කි.
- දෙවන වර්ෂය ආරම්භයේ දී යෙදිය යුතු කාරක ප්‍රාග්ධනය රු. 100 000 කි. මෙය ව්‍යාපෘතිය අවසානයේ උපලබ්ධි වේ.
- අදාල ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් මත වට්ටම් සාධක පහත දැක්වේ.

වර්ෂය	1	2	3	4
වට්ටම් සාධක	0.9	0.8	0.7	0.6

අවශ්‍යවන්නේ,

(1) ව්‍යාපෘතියේ මුදල් ගලාඒම් හා මුදල් ගලායාම් දක්වමින් ශුද්ධ වර්තමාන අගය ගණනය කරන්න.

(2) ශුද්ධ වර්තමාන අගය අනුව යන්ත්‍රය මිලට ගැනීම යෝග්‍යද නැද්ද යන බව සඳහන් කරන්න.

[ලකුණු 10]
[මුළු ලකුණු 40]

Hemal Perera